මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව
දිනය 2023.02.06

# මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි

ශ්‍රී ලංකා මහ බැංකු මගින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන මගින් සපයනු ලබන සේවාවන් වලට අදාල මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් පුළුල් නව රෙගුලාසි මාලාවක් සකස් කර ඇති අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන සඳහා ඒකාබද්ධ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් හඳුන්වා දීම අරමුණු කර ඇත. මෙම නව රෙගුලාසි මගින් වෙළඳපොළ හැසිරීම සුපරීක්ෂණය සඳහා අධීක්ෂකයන් හට අවශ්‍ය නියාමන බලතල නිශ්චය කිරීම අපේක්ෂා කරන අතර පසුකාලීනව මූල්‍ය පාරිභෝගිකයින් විසින් කරනු ලබන පැමිණිලි අවම කිරීමේ අවශ්‍යතාවය අරමුණු කර ගනිමින් මූල්‍ය සේවා ලබා දීමේදී / ලබා ගැනීමේදී සලකා බැලිය යුතු ක්ෂේත්‍ර පිළිබඳ සේවා සපයන්නන් සහ ලබන්නන් යන දෙපාර්ශවයටම පැහැදිලි බවක් ලබාදීම ද අපේක්ෂා කර ඇත.

ඒ අනුව, පාර්ශවකරුවන්ගේ උපදේශනයන් පුළුල්ව ලබා ගැනීමේ අරමුණින්, මෙම රෙගුලාසි කෙටුම්පත සම්බන්ධයෙන් තම නිරීක්ෂණ / අදහස් / යෝජනා ඉදිරිපත් කිරීමට මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් බැංකු හා මූල්‍ය අංශ ආශ්‍රිත සංගම් සහ මහජනතාව වෙත අවස්ථාව සලසා ඇති අතර අදාල කෙටුම්පත (ඉංග්‍රීසි) ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා (රෙගුලාසි කෙටුම්පත බාගත කර ගැනීම සඳහා වෙබ් දිගුව: consultation_paper_20230120_regulations_on_financial_consumer_protection_e.pdf(cbsl.gov.lk)) ප්‍රවේශ විය හැක. තවද, තම නිරීක්ෂණ / අදහස් / යෝජනා පහත ක්‍රම ඔස්සේ 2023.02.17 දින හෝ එදිනට පෙර අප වෙත ඉදිරිපත් කල හැක.

තැපැල් ලිපිනය : මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 1.

ෆැක්ස් : +94 112477744

ඊ මේල් : fcrd@cbsl.lk